**බෙන්තොට ප්‍රාදේශීය සභාව**

**ගාල්ල දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 අප්‍රේල් 06 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 15 දින ද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජුනි 29 දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට බෙන්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දී දැරූ රු.154,709 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි නඩත්තු කිරීමේ පිරිවැය ප්‍රාග්ධනිත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ශේෂය තුළ මෙවලම් හා උපකරණ වටිනාකම වූ රු.212,932 ක් ගිණුම් ගතකර තිබීමෙන් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වටිනාකම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම්වල ශේෂ එම වටිනාකමින් වැඩියෙන් ගිණුම් ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු දායක මුදල් රු.4,790,855 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ණයහිමියන් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි තොරතුරු ලබාගෙන නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ඉඩම් හා ගොඩනැගිලි ලේඛනයේ ඇතුළත් ඉඩම් කැබලි 46 ක වටිනාකම තක්සේරු කර ගිණුම් ගතකර නොතිබුණි. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයට ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.2,340,840 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

### 1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **ලැබිය යුතු ගිණුම්** | | |
| | 1993 සිට 2018 වර්ෂය දක්වා කාලයට අදාළ එකතු වටිනාකම රු.55,079,542 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 05 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ගිණුම් ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරමි. |
| **(ආ)** | **ගෙවිය යුතු ගිණුම්** | | |
| | එකතු වටිනාකම රු.6,627,985 ක් වූ ගෙවිය යුතු ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී ගෙවීම් කිරීමට කටයුතු කරමි. |

### 1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

**තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.307,110 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් සඳහා අවශ්‍ය තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 1.4 අනුකූල නොවීම්

### නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | **1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති** | | | |
| | (i) රීති 33 | වරිපනම් බදු ගෙවීම් පැහැර හැර ඇති පුද්ගලයින් පිළිබඳ ලැයිස්තු සහ දේපල තහනම් කිරීමේ වරෙන්තු ලැයිස්තු පිළියෙල කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිසි පරිදි කටයුතු කරමි. |
| | (ii) රීති 145 | ආපසු ගෙවිය යුතු තැන්පත් පිළිබඳ විස්තරාත්මක ප්‍රකාශයන් සකස් කර ලෙජරයේ දැක්වෙන ශේෂ සමඟ ගැලපීම් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිසි පරිදි කටයුතු කරමි. |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | | |
| (i) | මුදල් රෙගුලාසි 371 | තත්කාර්ය අත්තිකාරම් අදාල කාර්ය නිම වූ විගස පියවිය යුතු වුවත්, ඉකුත් වර්ෂවල ලබාගත් රු.75,787 ක් වූ අත්තිකාරම් පියවීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | මුදල් රෙගුලාසි 571 | වසර 02 ඉක්ම වූ රු.477,316 ක් වටිනා තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සභාව සතු ධාවන තත්ත්වයේ නොපවතින වාහන 05 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2016 | වාහන 08 ක ඉන්ධන දහන පරීක්ෂාව කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කරමි. |

## 2 මූල්‍ය සමාලෝචනය
----------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල
-------------------

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.16,989,568 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.13,977,444 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය
--------------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්
-----------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 22,567,724 | 31,687,457 | 21,178,858 | 25,896,886 | 22,123,117 | 18,156,859 | 18,283,719 | 10,121,944 |
| කුලී | 660,000 | 419,190 | 367,920 | 100,640 | 1,270,000 | 528,568 | 1,038,522 | 50,050 |
| බලපත්‍ර ගාස්තු | 611,250 | 546,050 | 535,450 | 14,850 | 626,500 | 635,150 | 727,350 | 18,250 |
| සේවා සඳහා ගාස්තු | 383,900 | 303,275 | 308,175 | - | 4,189,000 | 321,807 | 3,589,932 | 5,040 |
| | 24,222,874 | 32,955,972 | 22,390,403 | 26,012,376 | 28,208,617 | 19,642,384 | 23,639,523 | 10,195,284 |

#### 2.2.2 වරිපනම්
-------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **හිඟ වරිපනම් බදු** | | |
| ඉඳුරුව උප කාර්යාල බල ප්‍රදේශය තුළ පිහිටි විශේෂ දේපල වලින් 2019 සැප්තැම්බර් 30 දිනට රු.11,319,281 ක හිඟ ශේෂයක් පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | ඉදිරියේ දී හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි |

**2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ උසාවි දඩ රු.660,875 ක් හා මුද්දර ගාස්තු රු.77,114,621 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

**ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා විධිමත් සැලසුමක් ක්‍රියාත්මක කර නොතිබුණි. | දීර්ඝකාලීන වැඩපිළිවෙලක් සකස් කර, ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත් කළ යුතුවේ. | ඉඩමක් ලබා ගැනීමෙන් පසුව දීර්ඝකාලීන වැඩපිළිවෙලක් සකස් කරන බව දන්වමි. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | **සේවක පුරප්පාඩු හා අතිරික්තතා** | | |
| (i) | අනුමත තනතුරුවල පුරප්පාඩු 13 ක් සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කරවාගත යුතුවේ. | පුරප්පාඩු සඳහා අනුමැතියට යවා ඇත. |
| (ii) | ප්‍රාථමික සේවක ගණයේ සේවකයින් 13 දෙනෙකුට ද්විතීයික සේවක ගණයේ නිලධාරීන්ට අයත් රාජකාරි පවරා තිබුණි. | රාජකාරි කටයුතු විධිමත්ව පැවරීමට කටයුතු කල යුතුවේ. | රාජකාරී කටයුතු විධිමත්ව පැවරීමට කටයුතු කරමි. |

(ආ) **සේවක ණය**

| | | |
|---|---|---|
| විශ්‍රාම ගිය, මිය ගිය, සේවය හැර ගිය නිලධාරීන් 19 දෙනෙකුගෙන් අයවිය යුතු රු.66,197 ක් දීර්ඝ කාලයක් තිස්සේ අය නොවී පැවතුණි. | සේවක ණය අයකර ගත යුතුවේ. | ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරමි. |

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුවේ. | ඉදිරියේ දී අභ්‍යන්තර විගණනයක් සිදුකර වාර්තා එවීමට කටයුතු කරමි. |